පුනරීක්ෂණ අභ්‍යාස (භාග)

(1) පහත සඳහන් තත්‍ය භාග අතුරින් ඒකක භාග තෝරා ලියන්න.

$\frac{2}{3}, \frac{1}{7}, \frac{4}{15}, \frac{1}{3}, \frac{1}{100}$

(2) වරහන් තුළින් සුදුසු අගය තෝරා හිස්තැන් පුරවන්න.

(i) $\frac{3}{5}$ යනු $\frac{1}{5}$ ඒවා ..... කි. (1, 2, 3)

(ii) $\frac{2}{7}$ යනු ..... ඒවා 2 කි. $(\frac{1}{2}, \frac{1}{7}, \frac{1}{5})$

(iii) $\frac{1}{6}$ ඒවා 5ක් ..... කි. $(\frac{1}{30}, \frac{5}{6}, \frac{1}{5})$

(iv) $\frac{\square}{12}$ යනු $\frac{2}{3}$ ට තුල්‍ය වූ භාගයකි. (2 , 4, 8)

(3) පහත දැක්වෙන එක් එක් භාගය සඳහා තුල්‍ය භාග දෙක බැගින් ලියන්න.

(i) $\frac{2}{3}$ (ii) $\frac{3}{5}$ (iii) $\frac{6}{8}$ (iv) $\frac{36}{48}$

(4) පහත දැක්වෙන එක් එක් භාගයට තුල්‍ය වූ, හරය කුඩා ම වන තුල්‍ය භාගය ලියන්න.

$\frac{18}{30}, \frac{16}{24}, \frac{10}{35}$

(5) $\frac{4}{7}, \frac{1}{7}, \frac{6}{7}, \frac{5}{7}$ භාග ආරෝහණ පටිපාටියට ලියන්න.

(6) $\frac{7}{12}, \frac{5}{12}, \frac{2}{3}, \frac{1}{4}$ භාග අවරෝහණ පටිපාටියට ලියන්න.

(7) මුළු ලකුණු 25ක් ලබා දුන් ඇගයීමක් සඳහා සිත්මි ලබාගත් ලකුණු ගණන 21ක් නම්, ඇය ලබා ගත් ලකුණු සංඛ්‍යාව මුළු ලකුණු සංඛ්‍යාවෙන් භාගයක් ලෙස දක්වන්න.

(8) වෙළෙන්දකු මිල දී ගත් අඹ ගෙඩි 50ක තොගයකින් 8ක් නරක් වී තිබිණි.

(i) නරක් වූ අඹ ගණන, මුළු අඹ ගණනින් භාගයක් ලෙස දක්වන්න.

(ii) නරක් නොවූ අඹ ගණන, මුළු අඹ ගණනින් භාගයක් ලෙස දක්වන්න.